# සාමාන්‍ය සමයේ දසතුන්වන සතිය
# අඟහරුවාදා

## පළමුවන කියැවීම

උත්පත්ති පොතෙන් ගත් පාඨයෙකි.

උත්පත්ති 19: 15-29

"සමිඳාණෝ සොදොම් සහ ගොමෝරා නගර පිට ගිනි වර්ෂා වහින්ට සැළැස්වූ සේක."

පහන් වූ කල දූතයෝ ලොත් ඉක්මන් කරවමින්, "ඔබේ භාර්යාව ද මෙහි සිටින ඔබේ දූවරුන් දෙදෙනා ද රැගෙන හනිකට පිටත්ව යන්න. එසේ නොකළොත් මේ නුවර වනසාලීමේ දී ඔබත් මැරී යන හැකි ය"යි කීහ. එවිට ලොත් අදි මදි කළේය. එහෙත් සමිඳාණන් වහන්සේ ඔහුට අනුකම්පාව දැක්වූ සේක. අමුත්තෝ, ඔහු ද, ඔහුගේ බිරිඳ ද, දූවරුන් ද අතින් අල්ලා ගෙන නිවසින් පිටතට ගෙන ගොස් නුවරින් පිටත නතර කළහ.

නුවරින් පිටතට ඔවුන් ගෙන ගිය පසු, එක් දූතයෙක් ඔවුන්ට කතා කොට, "දැන් පණ බේරාගෙන ගැළවී යන්න. ආපසු නොබලන්න. මිටියාවතේ කිසිම තැනක නොනවතින්න. නොමැරෙන පිණිස කඳුකරයට පලා යන්නැ"යි කීය. එහෙත් ලොත් ඔවුන්ට උත්තර දෙමින්, "ස්වාමිනි, එසේ නොවේවා! ඔබේ දාසයා වන මට අනුකම්පා කරමින් මාගේ පණ බේරා ගැනීමට මට මඟ පෙන්වීමෙන් ඔබ මට කරුණාව දක්වා ඇත. එහෙත් කඳුකරයට පලා යාම නම් මට නොහැකිය. මඟදී කිසියම් විපතකට අසු වී මා මැරෙන්නට පුළුවන. බලන්න, අර නගරය, එය කුඩා

වුවත් පලා යාමට කිට්ටු ය. ගැලවී එහි යන්නට මට අවසරයි ඒ කුඩා නගරයක් නොවේ ද? එහෙත් මට එහි සුරක්ෂිතව ඉන්නට පුළුවනැ"යි කීය. දූතයා ද ඔහුට පිළිතුරු දෙමින්, "මෙන්න ඔබට මේ කියන දේටත් මම එකඟ වෙමි. ඔබේ කීම නිසා මම ඒ නගරය විනාශ නොකරමි. කඩිනම් කරන්න. ගැලවීමට එහි දුවන්න. ඔබ එහි පැමිණෙන තෙක් මට කිසිවක් කළ නොහැකි ය"යි කීය. මෙලෙස 'සුළු' යන අර්ථයයෙන් ඒ නගරයට 'ශොවර්' යන නම කියන ලදි.

ලොත් ශොවර් නුවරට ඇතුල් වූ කල හිරු උදා වී තිබිණි. එවිට සමිඳාණන් වහන්සේ සොදොම් සහ ගොමෝරා යන නගර පිට අහසින් ගෙන්දගම් සහ ගිනි වර්ෂා වහින්නට සැලැස්වූ සේක. උන් වහන්සේ ඒ නගර ද මුළු මිටියාවත ද නගර වාසීන් සැම දෙන ද පොළොවේ ගස් කොළන් ද විනාශ කර දැමූ සේක. ලොත්ගේ භාර්යාව ආපසු හැරී බැලුවා ය. එවේලේම ඇ ලුණු කණුවක් වූවා ය.

ආබ්‍රහම් උදෑසනින් නැඟිට කලින් සමිඳාණන් වහන්සේ හමු වූ ස්ථානයට ගියේය. ඔහු සොදොම් හා ගොමෝරා දෙස ද මුළු මිටියාවත දෙස ද බැලූ විට පුදුමයෙන් පුදුමයකි පොළොවෙන් බුර බුරා නගින දුම් කඳ, උඳුනකින් දමන දුමක් මෙන් දිටීය. එහෙත් දෙවියන් වහන්සේ මිටියාවතේ නගර විනාශ කරන විට දෙවියන් වහන්සේ ආබ්‍රහම් සිහි කළ සේක. ලොත් විසූ නගර වනසන විට ඒ විපතින් උන් වහන්සේ ලොත් ගලවා හැරිය සේක.

දේව වාක්‍යය එසේය.

## පිලිතුරු ගීය

ගීතාවලිය 26: 2-3, 9-12

පිලිතුර: සමිඳුනි, ඔබේ මහ කරුණාව අපි දුටිමු.

ගීය:

සමිඳුනි, මා සෝදිසි කොට පරීක්ෂා කර බැලුව මැනව.
මාගේ සිත හා මනස විමසා බැලුව මැනව.
ඔබේ මහා කරුණාව මාගේ දෙනෙතින් දිටිමි.
ඔබට විශ්වාසීව දවස් යැවීමි.

පව්වුන් හා සමග මා විනාශ නොකළ මැනව. මිනීමරුවන් සමග මා පහ නොකළ මැනව. ඔවුන්ගේ අත් පව්කළ අත් ය. ඔවුන්ගේ දකුණත් අල්ලසින් දූෂණය වී ඇත.
මම මේ නිදොස්කමින් දවස් යවමි. මා මුදා මට කරුණා කළ මැනව.

මාගේ පාද මඟ පිහිටා ඇත. ප්‍රසිද්ධ නමස්කාරයෙහි දී සමිඳුන් හට පැසසුම් ගී ගයන්නෙමි.

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
අපි සමිඳුන්ගේ උපකාරය උදක්ම බලා සිටින්නෙමු.
එතුමන්ගේ වචනය කෙරෙහි අපි බලාපොරොත්තුව තබමු.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
සමිඳුන්ට ප්‍රශංසා කරන්න.
එතුමන්ගේ වචන පොලොවේ ඉම දක්වා පැතිර යන්නේය.
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 8: 23–27

"සමිඳාණෝ මාරුතයට හා මුහුදට නිශ්චල වන්නට අණ කළ සේක.
එවිට මහත් නිසංසලයක් විය."

ජේසුස් වහන්සේ ඔරුවකට නැගුණු කල, ශ්‍රාවකයෝ උන්වහන්සේ සමඟ ගියහ. එවිට ඔරුව රළ පතරින් වැසී යන තරම් මහා චණ්ඩ මාරුතයක් මුහුදේ හැමීය. උන්වහන්සේ ඔරුවේ සැතපී හුන් සේක. එවිට ඔව්හු අවුත් උන්වහන්සේ අවදි කරවා, "ස්වාමීනි, අප ගැලෙව්ව මැනව. අප විනාශ වන්නට ළඟයැ"යි කීහ. උන්වහන්සේ ඔවුන්ට කතා කොට, "ඇදහිල්ල මදකමක හැටි! බියවන්නේ මන්ද" කියා නැගිට මාරුතයට හා මුහුදට නිශ්චල වන්නට අණ කළ සේක. එවිට මහත් නිසංසලතාවයක් විය. ඒ මනුෂ්‍යයෝ විස්මිතව "මෙතුමා කෙබඳු කෙනෙක් ද? සුළඟ හා මුහුද පවා මෙතුමාට කීකරු වෙතැ" යි කීහ.

සුවිශේෂ වාක්‍යය එසේය.